# තල (තල්)

## ශාස්ත්‍රයයි සංස්කෘතියයි



# "පිපුනි තල මලක් ලෙව්කේ වලව්වේ"

"අත්ත හොඳයි පොද වැස්සට ඉසලන්ට
පිත්ත හොඳයි තද වරමදු අඹරන්ට
ගොබය හොඳයි දස දරුමේ ලියවන්ට
එමල සොඳයි බුදු මගුලට ගෙනයන්ට"

තල් හෝ තල නමින් හැඳින්වෙන තාල වර්ගයේ ශාක වර්ග කීපයක් ඇත. ලිවීම සඳහා පුස්කෙල තනා ගත් තල් ගස් ලංකාවේ උඩරට පෙදෙස්වල විශේෂයෙන් දක්නට ඇත. භික්ෂූන් වහන්සේලාගේ වටාපත් සෑදීමට ගන්නා කුඩා වර්ගයේ තල් ගස් ද ලංකාවේ නොයෙක් ප්‍රදේශ වල වැවේ. යාපනය, මන්නාරම, මඩකලපුව, ත්‍රිකුණාමලය වැනි වියලි පෙදෙස් වල ට ආවේනික තල් ශාකය ආර්ථිකය කෙරෙහි විශේෂයෙන් බලපාන තාල විශේෂයකි. එම තල් ගසෙන් රා සැපයේ. එම මී රා වලින් තල් පැනි, තල් හකුරු, තල් සූකිරි නිශ්පාදනය කෙරේ. තම්බා වේලාගත් තල් අංකුර, කොට්ට කිලංගු නමින් වෙළඳ පළේ දක්නට ඇත. තල්ගෙඩිය ඉදුණු විට මිරිකා බීමට සකස් කර ගත හැකිය. වියලා ගත් තල්කොල වලින් පැදුරු, මලු, පෙට්ටි, ඇසුරුම් කුඩා හා වෙනත් විසිතුරු භාණ්ඩ නිපදවනු ලැබේ. ඇතැම් ගෙවල් වටා වැට ඉදිකර ඇත්තේ තල් අතු ඇසිරීමෙනි. කුඩා තල්කොල පෙට්ටි වල අසුරන ලද තල් හකුරු යාපන වැසියන්ගේ ආදයම් මාර්ගයකි.

තල් සූකිරි ආයුර්වේද ඖෂධයකි. කැස්සට සුවදායකය. තල් පොතු සිකනැලි විෂට ගුණදායක බව කියැවේ.

"රන් තැඹිලිය මල් තල් පොතු ගන්නේ
තම්පලාද මුල් සමකර ගන්නේ
තුන් වගයම කැඳ පිස දෙවමින්නේ
ඉන් සිකනැල් වෙවුලුම් ගුණවන්නේ"

අපේ පැරණි උගත්තු පොත පත ලිවීම සඳහා පුස-"කොල භාවිතා කලහ. පුස්කොල පොත් සඳහා ඔවුන් කොල තනා ගත්තේ ලොකු වර්ගයේ තල් ගස් වල ගොබ වලිනි. තල් ගොබ කපා ඉරටු අස්කර ඒවා වට්ටු වශයෙන් බැඳ හැලියක අසුරා තම්බා ගන්නේ අන්නාසි කොලද සමගිනි. තැම්බූ කොල මිටි ලිහා දවල්ට මද අව්වේ වේලා රාත්‍රී කාලයේදී හඳ එළිය ඇති පින්නේ දමනු ලැබේ. කොල හැකිලීම වැලැක්වීම සඳහා වට්ටු වශයෙන් ඔතා තබනු ලැබේ. දිනපතා උදේට කොල සෝදා මද අව්වේ දැමිය යුතුය. සතියක් දෙකක් මෙසේ කොල පිළියෙල කිරීමේදී ඒවා ඝනව් සුදු හැඟ ගනී.

"වියලි වියලි සේ සුදු පැහැරැගත්
තල් පතක් සේ"

බුත්සරණ ග්‍රන්ථයේ එන මේ උපමාව තල්කොල පිළියෙල කිරීම පිළිබඳවයි.

ඉහළ හරස් අතට එල්ලා බඳින ලද මැදපු පුවක් ලීයක දෙපසට අදිමින් සෝද සෝද කොල මැද ගැනීමෙන් පදම් කර ගත හැකියි. කොල හොඳකාර මැදීමෙන් පදම් වූ පසු උවමනා දිලට හා පළලට කොල කපාගෙන එකට තබා පොත් ගෙඩිය සාදා ගනු ලැබේ. රත්කළ යකඩයකින් පොත් ගෙඩියේ අංශ පුළුස්සා කෙඳි ගතිය නැති කෙරෙයි. කොලයේ දිග තුනට හා හතරට නවා බෙදූවිට ලැබෙන මධ්‍යස්ථාන දෙකේ හරිමැද දැවෙන යකඩ කූරකින් පුළුස්සා හිල් දෙකක් විදගනු ලැබේ. මෙම හිල් තුලින් යැවූ නූලකින් පොත බැඳ තැබිය හැකිය. කැටයම් කළ හෝ චිත්‍ර අඳින ලද තුනී ලෑලි පලු දෙකක් පිටට යෙදීමෙන් පොත සම්පූර්ණ වේ.

ඇතැම්විට මේ පොත් කම්බ සඳහා කැටයම් කළ ඇත්දළද භාවිතා කොට ඇත.

මෙසේ තනාගත් පුස්කොලවල අකුරු ලිවීම කෙරෙන්නේ පන්හිඳෙන් හෝ උල්කටුවකිනි. කොලය වම් අතේ තබාගෙන මාපට ඇඟිල්ලේ නියපොත්ත ස්පර්ෂ වන සේ පන්හිඳ හසුරුවමින් අකුරේ හැඩය ගැනීමට දක්ෂ ලේඛකයෝ එදා ගම්වල සිටියහ. මෙසේ ලස්සන අත් අකුරු පමණක් නොව අලංකාර චිත්‍රද පුස්කොලයේ කැපිය හැකි දක්ෂයෝ වූහ. පුස-"කොල පොත්වල පිටු මාරුවීම වැලැක්වීම සඳහා "ක" යන්නේ පටන් හෝඩියේ අකුරු "ක, කා, කි, කී ආදී වශයෙන් යොදාගෙන අංකනය කෙරේ. කේන්දර ලිවීම සඳහා තනිකර පුස්කොලයක් ම යොදා ගැනේ. එය ඔතා තැබීමට අවශ්‍ය කොපුවද එම කොලයෙන්ම සකස් කර ගැනීමට කේන්ද්‍රකරුවෝ දැන සිටියහ.

තල්පිටිය, තල්වත්ත, තල්දෙන, තලවින්න, තල්ගහගෙදර, තලගහපැල වැනි ග්‍රාම නාම යෙදී ඇත්තේ තල්ගස් ඇසුරෙන් විය යුතුයි. අපේ භික්ෂූන් වහන්සේලාගේ වටාපතත් ඇතැම්විට ඉසිලීමට භාවිතා වන ගොටුවත් කුඩා වර්ගයේ තල්ගස්වල ගොබ වියලා තනාගනු ලැබේ.
තල් ගසක මලක් පිපෙන්නේ ගසේ අවසානය ළඟා වූ විටයි. එබැවින් තලමලක් පිපීම කලාතුරකින් දක්නා ලැබෙන්නකි. එය පෙදෙසට අශුභ නිමිත්තක් සේ සැලකිණි. එහෙත් පිපුණු තල මලක චමත්කාරය දුටු ජන කවියෝ ඒ මල් වල වරුණය (වර්ණනාව) කවියට නැගූහ. එබඳු තල මල් කවි කීපයක් ඉදිරිපත් කරමි.

"අහස උසැති උස පමණකි තල මලකි
මහුදකි රැළ දිය පිට යන තලගොයෙකි
දේශ දේශවල තියෙනා සත් නමකි
මෙවැනි අවතාර අම්මේ තලමලකි"

"යම්තම් ගුරු ලඝු යවහන් හැර කවි සිහි නුවණට මගේ නිපුන කළේ
තැන් තැන්වල මල් රේණුද සිදිලා සුළඟට කැරකුනි අහස් තලේ
අන්දම් රූබර කැකුළු නුරාවට රොනට ඇවිත් වට බමරු කැලේ
රන් වන් තලමල පිපුනා දුටුවද පංසල් වත්තේ ඉහළ වෙළේ"

"සතර වරම් සැම දෙවියන් වරමින් සැදුනි උයන් දෙක පරසිද්දේ
නිතර දහම් ගුණ මුළු ලෝ පතුරන මුනිඳුට වසතුව කළ යුද්දේ
ගණන් හිලව් වැඩ බලන්ට තැනුනේ තලගහ මඩුවකි ගම මැද්දේ
ගණන් ඇතිව විසි නවයක් තලමල් පිපුනිය සකි උයනේ මැද්දේ"

"තල්අතු කප්පා හිරිඅතු වේලා වෙහෙර මුවාවෙන් තිබ්බානම්
බණපොත් ලියවා බරපැන් ඇරලා බුදුන්ට පූජා කෙරුවා නම්
කොළඹට ඇරලා සුදු පිළිගෙන්වා තුන්මාලේ මග එලුවානම්
මිණිවම් ගමුවේ සුරුවම් තලමල වෙහෙරට කිට්ටුව පිපුනා නම්"


"ගල්කැටි මංකඩ ගලපිට ඉඳගෙන වතුර දෙකක් වක්කරගත්තේ
එතැනින් එපිටට පිටියට බැසලා වරලස පීරා බැඳගත්තේ
නෑනෝ කියලා අත දික්කරලා තල්මල් හතරක් දැක ගත්තේ
පිපුනයි තල්මල් හතළිස් හතරක් ගලතර උයනේ හැම පැත්තේ"

"ලෙලදෙමිනේ මල උඩ ගුවනේ මුතුකුඩ
ලෙසිනේ සුළඟට වැනුනේ
සොඳ ලෙසිනේ මිණි කිරුළු මෙනේ ඈතට
පෙනුනේ රන්කොතලෙසිනේ
අපි ගොසිනේ මල දැක නෙතිනේ සිට පිරිය
උනේ නිම නැති ලෙසිනේ
මෙම ලෙසිනේ තලමල පිපුනේ සකි පියසකි-
නේ සොඳගල මුදුනේ"

"පුංචි පුංචි බණ්ඩාරගෙ වලව්වේ
බංකු ලෑලි ඇදලා වැඩ ඉනංගු වේ
රෑන ගිරව් උඩ ඉගිලෙති තලව්වේ
පිපුනි තලමලක් ලෙව්කේ වලව්වේ"

උඩරට පෙදෙස්හි පංසල් හා වලවු ඉඩම් වල මෙබඳු තලමල් පිපී තිබුණු අන්දම ගැමියන් කවියට නගා මෙසේ ගායනා කරන්නට ඇත්තේ මහත් රුචියකිනි.

සිංහල සාහිත්‍යයේ පෝෂණයට තල්පතයි පන්හිඳයි බොහෝ සෙයින් උපයෝගී වූ අන්දම පැහැදිලි කරුණකි. බණපොත්, වෙදපොත් හා වෙනත් විවිධ විෂයයන් අලලා ලියා තිබුණු අපේ පුස්කොල පොත් වලින් ගැනීමට කාලය පැමිණ ඇතැයි සිතමි. පංසල ඇසුරෙන් රැකුණු අපේ පොත්ගුල් නැමැති දැනුම් ගබඩා ජනතාවගේ පල ප්‍රයෝජනය සඳහා යොදාගැනීමට පහසුකම් සැලසීම වගකිව යුත්තන්ගේ කාරියක් වනු ඇත.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි


සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

03 8707 4604
0402 025 516

email
sannasanews@gmail.com
ads.sannasa@gmail.com



